# තොරතුරු පනත යටතේ නම් කළ නිලධාරිට යවන අභියාචනය

1 message

**Tharindu Jayawardhana** <tharindu.rti@gmail.com> Sun, 19 Mar 2023 at 09:35
To: govanalyst@sltnet.lk
Cc: CSR RTI <csr.rti281@gmail.com>

නම් කළ නිලධාරි,
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව.

**<u>තොරතුරු පනත යටතේ නම් කළ නිලධාරිට යවන අභියාචනය</u>**

ඉහත පනතේ 25(3) එනම් පැය 48ක් තුළ ප්‍රතිචාර දැක්විය යුතු ජීවිතයට හා පෞද්ගලික නිදහසට බලපාන තොරතුරක් 2023 මාර්තු 14 වැනිදා තොරතුරු නිලධාරි, රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා සිටි අතර ඊට මේ දක්වා ප්‍රතිචාර දක්වා නැත. ඒ අනුව මෙම අභියාචනය ඉදිරිපත් කරමි.

**තොරතුරු ඉල්ලීම පහත දැක්වේ.**

තොරතුරු නිලධාරී,
රසපරීක්ෂක දෙපාර්තමේන්තුව.

**<u>තොරතුරු පනතේ 25(3) යටතේ කරනු ලබන තොරතුරු ඉල්ලම</u>**

ඉහත පනත යටතේ පහත තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු. මේ දිනවල උද්ඝෝෂණ විශාල ප්‍රමාණයක් පැවතීමත්, උද්ඝෝෂණවලට කඳුළු ගෑස් විශාල ප්‍රමාණයක් එල්ල කිරීමත් නිසා පුරවැසියන්ගේ ජීවිතය සහ පෞද්ගලික නිදහසට දැඩි බලපෑමක් වී තිබේ. එසේම ඉල්ලා ඇති තොරතුරුවලට අදාල මිලදී ගැනීම තත්ත්ව පරීක්ෂණයකින් තොරව සිදු කිරීමට යන බවට තොරතුරු ඇති බැවින් එමගින් පුරවැසියන්ගේ ජීවිතයට සහ පෞද්ගලික නිදහසට දැඩි බලපෑමක් එල්ල විය හැකිය. එසේ හෙයින් මෙම තොරතුරු ඉල්ලීම පනතේ 25.3 යටතට වැටෙන බැවින් පැය 48ක් තුළ ප්‍රතිචාර බලාපොරොත්තු වෙමු.

1) 2010 වසරේ සිට 2023/03/14 දින දක්වා කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බවල සාම්පල පරීක්ෂා කිරීමක් සිදු කිරීමට ශ්‍රී ලංකා පොලිසිය අවස්ථා කොපමණ ප්‍රමාණයකදී ඉල්ලීම් කර තිබේද? එම ලිපිවල සහතික පිටපත් ලබා දෙන්න.

2) අදාල ඉල්ලීම්වලදී අවස්ථා කොපණ ප්‍රමාණයකදී කඳුළුගෑස් උණ්ඩ සහ බෝම්බ සාම්පල රස පරීක්ෂක දෙපාර්තමේන්තුව පරීක්ෂණයට ලක් කර තිබේද? එම පරීක්ෂණ වාර්තාවල සහතික පිටපත් ලබා දෙන්න.

3) කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බවල අන්තර්ගතය ගැන පරීක්ෂා කිරීමේ හැකියාවක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට තිබේද?

4) කඳුළු ගෑස් උණ්ඩ හෝ බෝම්බ කල් ඉකුත්වූ පසු සිදුවන තත්ත්වය ගැන ඔබ ආයතනය පරීක්ෂණ සිදු කර තිබේද? තිබේ නම් ඊට අදාල ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න.

අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකි.


තරිඳු ජයවර්ධන
සමාජය හා සාමයික කේන්ද්‍රය
281,ඩීන්ස් පාර,
කොළඹ 10.

tharindu.rti@gmail.com

0710661417

**Tharindu Jayawardhana**
0710 66 14 17 / 0777 66 14 17
tharindu.rti@gmailcom
www.medialk.com
https://www.youtube.com/c/Medialkdotcom